# ප්‍රස්ථාපිරුළු-4

31) ඉඟුරු දී මිරිස් ගත්තා වගෙයි

අනවශ්‍ය දෙයක් ඉවත් කර ඊට වඩා අනවශ්‍ය දෙයක් ළං කර ගැනීම

32) කබලෙන් ළිපට වැටුනා වගෙයි

කරදරයකින් තවත් ඊට වඩා කරදරයකට වැටීම

33) අකලට එලගත් ගෙඩිය වගෙයි

නොසිතූ වෙලාවක වාසියක් වීම

34) අත්තික්කා ගහේ මල් පිපුණා වගෙයි

පුදුම විය යුතු දෙයක්

35) කොහොඹ ගහට කරවිල වැල ගියා වගෙයි

නරකට නරක එකතු වීම

36) පැණි වරකා ගහට හෙණ ගැහුවා වගෙයි

හොඳට සිටි දෙදෙනෙක් අමනාප වීම හෝ හොඳට තිබූ දෙයක් විනාශ වීම

37) අන්දරේ සීනි කෑවා වගෙයි

උපායශීලීව තම අරමුණ ඉටු කර ගැනීම

38) අන්ධයො ඇතාගෙ හැටි කීවා වගෙයි

යමක් ගැන හරි හැටි නොදැන කතා කිරීම

39) අබරා සිල් ගත්තා වගෙයි

අවබෝධයෙන් තොරව වැඩකිරීම

40) අහසට ඉනිමං බඳිනවා වගෙයි

නිශ්ඵල ක්‍රියාවක යෙදීම